පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

| ශ්‍රේණිය |
|---|
| 11 |

# තෙවන වාර පරීක්ෂණය - 2023

## කෘෂි හා ආහාර තාක්ෂණය - I, II

පාසලේ නම : ..........................................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 03

## I පත්‍රය

- **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

1) ශ්‍රී ලංකාවේ මහා වැව් තැනවීම ආරම්භ වන්නේ
   1. ධාතුසේන රජ සමයේ සිටය.
   2. පරාක්‍රමබාහු රජ සමයේ සිටය
   3. දේවානම්පියතිස්ස රජ සමයේ සිටය.
   4. වසභ රජ සමයේ සිටය.

2) භූමිය මැනීම පිළිබඳ සුක්ෂම තාක්ෂණයක් පැරැන්නන් සතුව තිබූ බවට සාක්ෂියකි
   1. බිසෝ කොටුව
   2. යෝධ ඇල
   3. රළපනාව
   4. ගල් කණු

3) සටහන් නොවන වර්ෂාමානය තුළ එකතුවන වර්ෂා ජලය ප්‍රමාණය අනුව, වර්ෂාපතනය ප්‍රකාශ කෙරේ. එහිදී මනිනු ලබන්නේ එම ජල කොටසේ
   1. උසය
   2. ඝණත්වය
   3. පරිමාවය
   4. ස්කන්ධය

4) පහතරට වියළි කලාපයේ කෘෂි පාරිසරික කලාප ගණන වනුයේ
   1. 8 කි
   2. 11 කි
   3. 20 කි
   4. 15 කි

5) කෘෂි කර්මාන්තයේ දී බෝග වගා කෙරෙන ප්‍රධාන උපස්ථරය හෙවත් වගා මාධ්‍ය වන්නේ පසයි. ඒ අනුව පස පිළිබඳව දක්වා ඇති සාවද්‍ය ප්‍රකාශය වන්නේ
   1. පාංශු ජීවීන්ට වාසස්ථානයක් වීම
   2. බෝගවල මූල පද්ධති දරා සිටීම
   3. බීජ ගබඩාවක් ලෙස ශාක පරපුරේ පැවැත්ම තහවුරු කිරීම
   4. කාබන් ඇතුළු ව බෝග සඳහා අවශ්‍ය සියලුම පෝෂක මූලද්‍රව්‍ය සැපයීම

6) විෂ්කම්භය මිලිමීටර් 0.002 ට වඩා අඩු ඉතා කුඩා කලිලයකි
   1. වැලි
   2. සියුම් වැලි
   3. මැටි
   4. බොරළු

7) මූලික බිම් සැකසීමේ පියවරක් නොවන්නේ
   1. පැල අවට පස බුරුල් කිරීමය
   2. පස සැකසීම හා පෙරළීමය
   3. කැට පොඩි කිරීම හා සමතලා කිරීමය
   4. පාත්ති සැකසීමය

8) පහත බෝග අතරින් වැඩීම පරතරයක් සහිතව සිටුවන බෝගය කුමක් ද?
   1. මඤ්ඤොක්කා
   2. වට්ටක්කා
   3. පතෝල
   4. කිරි අල

9) විද්‍යාත්මක බෝග වර්ගීකරණයට අනුව පෝඒසියේ කුලයට අයත් බෝග කාණ්ඩය වනුයේ
   1. මෑ, උඳු, කඩල
   2. මෑ, වී, කුරක්කන්
   3. වී, බඩඉරිඟු, කුරක්කන්
   4. පොල්, පුවක්, කිතුල්

10) උස් තවාන් පාත්තියක සම්මත පළල මීටර්
   1. 2කි
   2. 1 කි
   3. 1.5 කි.
   4. 2.5 කි.

11) විසිරි ජල සම්පාදනය ක්‍රමයේ වාසියක් වන්නේ

1. ස්ථාපනය කිරිම සඳහා වැයවන මූලික වියදම අඩුවීමය
2. උසට වැඩෙන බෝග සඳහා ද යොදගත හැකි වීමය
3. අධික සුළං සහිත ප්‍රදේශ සඳහා ද යොදගත හැකි වීම
4. සමතලා නොවන ඉඩම්වලටද යොදගත හැකි වීමය

12) අතිරික්ත ජලය ඉවත් කිරිම සඳහා ශාක යොද ගැනිම වෙනත් රටවල ඉතා ජනප්‍රිය ක්‍රමයකි. ශ්‍රී ලංකාවේ මේ සඳහා යොද ගත හැකි ශාකයක් නොවන්නේ

1. පන් වර්ග
2. වැටකේ ශාක
3. ගිලිරිසිඩියා
4. කඩොලාන ශාක

13) රතු පැහැයෙන් , ස්පටික ලෙස පවතින ජලයේ හොඳින් දියවන රසායනික පොහොරකි

1. යූරියා
2. ත්‍රිත්ව සුපර් පොස්පේට්
3. මියුරියේට් ඔෆ් පොටෑෂ්
4. රොක් පොස්පේට්

14) බෝග වගාවේ දී ජල සම්පාදනයත් සමගම රසායනික පොහොර යෙදීම වර්තමානයේ සුලභව දක්නට ලැබේ. එමගින් ශ්‍රම අවශ්‍යතාවය ද අඩු වේ. මේ සඳහා උචිත ජල සම්පාදන ක්‍රමය වන්නේ

1. තීරු ජල සම්පාදනය
2. බේසම් ජල සම්පාදනය
3. වළලු ජල සම්පාදනය
4. බිංදු ජල සම්පාදනය

15) ගොඩ ක්‍රමයට කොම්පොස්ට් සකස් කිරිමේ දී සෑම සතියකට වරක් ම උල් කරන ලද ලීයක් කොම්පෝස්ට් ගොඩට ඇතුළු කොට මැන බලනුයේ

1. තෙතමනය
2. වයනය
3. උෂ්ණත්වය
4. පාංශු ජීව ගහනය

16) ආක්‍රමණශීලි වල් පැළෑටි කාණ්ඩයකි

1. පාතීනියම්, ගඳපාන, විඩේලියා
2. ගිනි තෘණ, ඇපල, දියහබරල
3. බජිරි, යෝධ නිදිකුම්බා, ගඳපාන
4. ජපන් ජබර, තුනැස්ස, ගිරාපලා

17) වට්ටක්කා වගාවක තැනින් තැන පැළවලට පත්‍ර විචිත්‍ර රෝගය වැළඳී තිබුණි. මෙම රෝගය පාලනයට අනුගමනය කළ යුතු සාර්ථකම ක්‍රියා මාර්ගය වන්නේ

1. දිලීර නාශක ඉසීමය
2. රෝගී පත්‍ර පමණක් කඩා ඉවත් කිරීමය
3. රෝගී ශාක ගලවා ඉවත් කිරීමය
4. ක්ෂේත්‍රයේ ජලවහනය දියුණු කිරීමය

18) ගොවියෙක් තම වැටකොළු වගාවේ පෙරමෝන උගුලක් සවිකරන ලදි. මෙමගින් පාලනය කිරීමට අපේක්ෂිත පළිබෝධකයා වන්නේ

1. ඉල් මැස්සා
2. කුඩිත්තා
3. පළතුරු මැස්සා
4. අවුලකපෝරා

19) බහු වාර්ෂික වල් පැළෑටියකට උදහරණයක් වනුයේ

1. හුලංතලා
2. කුප්පමේනියා
3. මොණරකුඩුම්බිය
4. ගඳපාන

20) බිත්තර වී පැළ කිරිමේ දී එම බීජ යහන් කිරිම සිදු කරනු ලැබේ. එම යහන් කාලය වන්නේ

1. පැය 12 - 24 ය
2. පැය 24 - 48 ය
3. පැය 10 - 12 ය
4. පැය 12 - 48 ය.

21) වර්තමානයේ දී වී වගාව සිදු කිරිම සඳහා පැරෂුට් ක්‍රමය ඉතා ජනප්‍රියය. මේ සඳහා යොද ගනු ලබන තවාන් ක්‍රමය වන්නේ

1. මඩ තවාන
2. තැටි තවාන
3. ගොඩ තවාන
4. ඩැපොග් තවාන

22) බද්ධ කිරීම සඳහා යොද ගන්නා ග්‍රාහක ශාකයක තිබිය යුතු ලක්ෂණයක් වන්නේ

1. උසස් අස්වැන්නක් ලබාදීමය
2. සක්‍රීය අංකුර තිබීමය
3. එළදරු ශාකයක් වීමය
4. ශක්තිමත් මූල පද්ධතියක් තිබීමය

23) පත්‍ර මඟින් ප්‍රචාරණය කළ හැකි ශාකයක් වන්නේ

1. බෙලි 2. බිගෝනියා
3.බතල 4. ඉන්නල

24) බීජ 100 ක නියැදියක් ගෙන ප්‍රරෝහණ ප්‍රතිශතය පරීක්ෂා කිරීමේ දී බීජ වලින් 13 ක් ප්‍රරෝහණ වී නොතිබුණි. එම බීජ නියැදියේ ප්‍රරෝහණ ප්‍රතිශතය වන්නේ

1. 13% කි 2. 0.13 කි
3. 87% කි 4. 0.87 කි

25) කොකෝපීට්, වර්මිකියුලයිට්, හා රොක්වුල් යනු

1. සත්ව නිෂ්පාදන කිහිපයකි
2. නිර්පාංශු වගාවේ දී භාවිතා කරනු ලබන රෝපණ මාධ්‍ය කිහිපයකි
3. පාෂාණ වර්ගයකි
4. ද්වි කාර්යය කුකුළු වර්ග කිහිපයකි

26) කිසියම් භූමියක පස, ජලය, පෝෂක හා ජෛව විවිධත්වය ආරක්ෂාවන පරිදි අවම යෙදවුම් භාවිතා කරමින් සිදු කරන ගොවිතැන් ක්‍රමය හඳුන්වන්නේ

1. සමෝධානික ගොවිතැන 2. සංරක්ෂණ ගොවිතැන
3. හේන් ගොවිතැන 4. අතුරු බෝග වගාව

27) මෑතක සිට එළවළු හා පලතුරු ප්‍රවාහනයේ දී ගෝනි වෙනුවට ප්ලාස්ටික් බඳුන් භාවිතය අනිවාර්යය කර ඇත. මෙයට හේතුව ලෙස ශිෂ්‍යයෙකු ඉදිරිපත් කළ කරුණු පහත දැක්වේ

A – ප්‍රවාහන වියදම් අවම කිරීම
B – පසු අස්වනු හානි අවම කිරීම
C – අස්වනු වල ඉහල ගුණාත්මයන් පවත්වා ගැනීම

මේ අතරින් නිවැරදි වන්නේ,

1. A හා B ය 2. Bහා Cය
3. A හා C ය 4. A,B හා C ය

28) ප්‍රධාන ආහාර වේලෙන් පසු පැය 1 -2 අතර කාලයේ දී තේ, කෝපි, වැනි පාන වර්ග ගැනීමෙන්

1. ආහාරයේ ඇති විටමින් අවශෝෂණයට බාධා ඇති වේ.
2. ආහාරයේ ඇති ප්‍රෝටීන් අවශෝෂණයට බාධා ඇති වේ.
3. ආහාරයේ ඇති යකඩ අවශෝෂණයට බාධා ඇති වේ.
4. ආහාරයේ ඇති කාබෝහයිඩ්‍රේට් අවශෝෂණයට බාධා ඇති වේ.

29) ආහාරවල අගය වැඩි කිරීමේ ක්‍රමයක් නොවන්නේ

1. බිලාන්වීකරණය 2. අවම සැකසීම
3. ප්‍රබල කිරීම 4. සරු කිරීම

30) වෙළඳපොලෙන් ගෙන එන ලද මාළු ටින් එකක පතුල සහ මුදුන ඉදිමී පිටතට නෙරා තිබුණි. මෙයට හේතුව වන්නේ

1. එය කල් ඉකුත් වී තිබීමය 2. ඒ තුළ ක්ෂුද්‍ර ජීවීන් වර්ධනය වී තිබීමය
3. එය ප්‍රතිවිකිරණයට ලක්කර තිබීමය 4. ටින් එක තුනී තහඩු වලින් සාද තිබීමය

31) මල් පිපීමට ආසන්නව ඇති තෘණ කපා කොළ පාට රැකෙන පරිදි මද පවනේ වියලා සංරක්ෂණය කර නිපදවන ගව ආහාරය

1. හේ 2. පෝෂ තෘණ
3. සයිලේජ් 4. ගෝචර තෘණ

32) පහත සඳහන් එළ ගව වර්ග අතරින් මනා පාලනයක් යටතේ වැඩිම කිරි නිෂ්පාදනයක් ලබා දෙන ගව වර්ගය වන්නේ

1. රතු සින්දි 2. ෆ්‍රීෂියන්
3. ජර්සි 4. සහිවාල්

33) නිදි බරව එකට ගුලි වී සිටින කුකුළු පැටවුන්ගේ ගුද මාර්ගය අවට සුදු පැහැති මළ ද්‍රව්‍ය බදමයක් සේ ඇලී තිබෙනු දක්නට ලැබුණි. මෙම රෝගය වනුයේ

1. පුල්ලෝරම් 2. බුරුලු ප්‍රදාහය
3. කොක්සිඩියෝසිස් 4. ගව රක්තාශය

34) ගව දෙනකගේ මද චක්‍රයේ දින

1. 21 | 2. 30

3. 285 | 4. 305

35) ගව පැටවකු ඉපදුණු විගස පළමුවෙන් ම කළයුතු සත්කාරය වනුයේ

1. මුල් කිරි (කොලෙස්ට්‍රම්) බීමට සැලැස්වීමයි
2. පෙකිනිවැල කපා අයඩින් ආලේප කිරිමයි
3. නාසයේ හා මුඛයේ ඇති ශ්ලේෂමල පිස දැමීමයි
4. ජලය ස්වල්පයක් බීමට සැලැස්වීමයි

36) කුකුළු පාලනයේ දී බ්‍රොයිලර් අවසාන සලාකය සැපයිය යුතු වන්නේ

1. දින 1 - 28 අතර වයසේ දීය
2. දින 1 - 42 අතර වයසේදීය
3. දින 28 - 42 අතර වයසේදී ය
4. දින 10 - 42 අතර වයසේදීය

37) නවීකෘත අභ්‍යන්තර පරිසර තත්ව යටතේ ඇසිරීමේ දී ඇසුරුම තුළ අන්තර්ගත කරන වායුව වනුයේ

1. ඔක්සිජන්
2. ආගන්
3. නයිට්‍රජන්
4. හයිඩ්‍රජන්

38) SLS සංකේතය මඟින් දක්වන ආයතනය වනුයේ

1. ශ්‍රී ලංකා සුරාබදු ආයතනය
2. ශ්‍රී ලංකා සතොස ආයතනය
3. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය
4. ලෝක ආහාර සංවිධානය

39) කිරිපිටි වලට තිරිඟු පිටි මිශ්‍ර කර ඇති බව හඳුනා ගැනීමට කළ හැකි පරීක්ෂණයක් වන්නේ, එම කිරි මිලිලීටරයට

1. දෙහි බිංදි දෙකක් එකතු කිරිමය
2. ග්ලිසරීන් බිංදු දෙකක් එකතු කිරිම
3. අයඩින් බිංදු දෙකක් එකතු කිරිමය
4. පොල්තෙල් බිංදු දෙකක් එකතු කිරිමය

40) ජාත්‍යාන්තර සහල් පර්යේෂණ ආයතනය

1. ISO
2. IUSS
3. IRRI
4. USDA

## II පත්‍රය

- **පළමු ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න.**

1) බෝග වගාවේදී උපරිම අස්වැන්නක් ලබා ගැනිම සඳහා බිම් සැකසීමේ සිට අස්වනු නෙළීම දක්වා ඇති සියලු කටයුත මැනවින් කළමණාකරණය කළ යුතු වේ.

   i) ගෙවත්ත වගා කරන පහත සඳහන් බෝග කාණ්ඩ වලට **උදාහරණ 2 ක** බැගින් සඳහන් කරන්න.

      A – සොලනේසියේ

      B – මැල්වේසියේ

   ii) කුඩා ගෙවත්තක අතුරුයත් ගෑම සඳහා භාවිතා කළ හැකි **උපරකරණ 2 ක්** සඳහන් කරන්න

   iii) බෝග වගාවට නුසුදුසු පසක් පුනරුත්තාපනය කිරිමට කළ හැකි **උපක්‍රම 2ක්** හඳුන්වා දෙන්න

   iv) ගෙවත්තක ජලවහනය දුර්වල ස්ථානයක සිටුවීමට සුදුසු **බෝග වර්ග 2ක්** යෝජනා කරන්න

   v) පහත සඳහන් තවාන් වර්ග වලට සිටුවීමට නිර්දේශිත **බෝගය** බැගින් දක්වන්නන

   vi) බෝග වගාවේ සිටුවීමට යෝග්‍ය කෘමි විකර්ෂන ශාක වලට **උදාහරණ 2ක්** දක්වන්න.

   vii) පස සාරවත් කිරිම සඳහා වගා බිමට යෙදීමට සුදුසු අර්ධ පොහොර මිශ්‍රණයක අඩංගු විය යුතු **ප්‍රධාන පෝෂක** 2 ක් සඳහන් කරන්න

   viii) එළවළු වගාවකදී රෝග වැළඳීම වළක්වා ගැනීමට ගත හැකි **ක්‍රියාමාර්ග 02 ක්** ලියන්න

   ix) වගා භූමියක පැල මැලවී තිබූ අවස්ථාවක පවා පසේ අඩංගු වී පවතින **ජල වර්ගය** කුමක් ද?

   x) බෝග වගාවට ආලෝකය වැදගත්වන ආකාරය හඳුන්වා දෙන්න.

2) කෘෂිකාර්මික කටයුතුවල නිරත වීමේ දී දේශගුණය හා පාංශු සාධක පිළිබඳව අවධානය යොමු කිරීම ඉතා වැදගත් වේ.

   i) a) කාලගුණය හා දේශගුණය හඳුන්වන්න

      b) ශ්‍රී ලංකාවට වර්ෂාව ලැබෙන **ක්‍රම 02ක් නම්** කරන්නන

      c) පහත සංසිද්ධි සඳහා බලපාන කාලගුණික පරාමිති **1 බැගින්** ලියා දක්වන්න

         - උත්ස්වේදනය
         - ශාක රෝග වැඩිවීම

   ii) a) පසක් ආම්ලික වීමට බලපාන හේතු **සාධක 2 ක්** ලියන්න

      b) පසක ක්ෂාරියතාවය මඟහරවා ගැනීමට යොදගත හැකි **උපක්‍රම 2 ක්** නම් කරන්න

   iii) බෝග වගාව සඳහා පාංශු වාතයේ **වැදගත්කම් 2 ක්** ලියන්න

3) ශාකවල පැවැත්ම සඳහා අත්‍යාවශ්‍යය පෝෂක හඳුනා ගැනීම ඉතා වැදගත් වේ.

   i) a) බෝගවල පැවැත්ම සඳහා අවශ්‍ය මහා මූල ද්‍රව්‍ය හා ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය **දෙක බැගින්** ලියා දක්වන්න

      මහා මූල ද්‍රව්‍ය

      ක්ෂ්ද්‍ර මූල ද්‍රව්‍ය

      b) ශාකවලට පොටෑසියම් ලබා දීමට රසායනික පොහොර **වර්ගයක්** නම් කරන්න

      c) සෘජු පොහොර හා මිශ්‍ර පොහොර යනු කුමක් දැයි පැහැදිලි කර ඒවා සඳහා උදාහරණ ලියා දක්වන්නන

   ii) a) බෝග වගාවේදී රසායනික පොහොර කාර්යක්ෂමතාව වැඩි කිරීමට ගත හැකි **ක්‍රියාමාර්ග 2 ක්** සඳහන් කරන්න

      b) ගෙවත්තේ දී භාවිතා වන **කාබනික පොහොර වර්ග 2 ක්** සඳහන් කරන්න

   iii) බෝග වගාවට කාබනික පොහොර යෙදීමෙන් අත්වන **වාසි 4 ක්** ලියන්න

4) බෝග වගාවේදී ශාක පෙන්නුම් කරන රෝගී ලක්ෂණ අනුව ශාකවලට වැළදී ඇති රෝග හඳුනාගත හැකිය.

   i) a) වී වගාවට වැළදෙන **දිලීර රෝගයක්** නම් කරන්න

      b) වල් පැලෑටි පාලනය කිරිම සඳහා යෙද ගත හැකි රසායනික නොවන **ක්‍රම 4 ක්** ලියා දක්වන්න.

ii) පහත දැක්වෙන රෝග වැළඳීමට හේතුවන රෝග කාරක ජීවී කාණ්ඩය සඳහන් කරන්න.

a – නිවිති මුල් ගැට රෝගය

b – හිටු මැරීම

c - තවාන් දියමලං කෑම

d – බණ්ඩක්කා පත්‍ර විචිත්‍ර රෝගය

iii) a) කෘමි රූපාන්තරණය, පූර්ණ රූපාන්තරණය හා අර්ධ රූපාන්තරණය ලෙස කෙටියෙන් පැහැදිලි කර එක් එක් රූපාන්තරණය සඳහා **උදාහරණ එක** බැගින් සඳහන් කරන්න.

b) දුඹුරු පැල කීඩෑ හානිය පාලනයට ඔරොත්තු දෙන වී **ප්‍රභේද 2ක්** සඳහන් කරන්න.

5) අතිරික්ත කෘෂි නිෂ්පාදන අනාගතයේ දී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඒවා නරක්වීම වළක්වා ගැනීමට විවිධ පරිරක්ෂණ ක්‍රම යොදා ගත හැකිය.

i)a) ආහාර පරිරක්ෂණ **ක්‍රම 3ක්** සඳහන් කර එක් එක් ක්‍රම සඳහා උදාහරණය බැගින් ලියන්න

b) එළවළු අස්වනු නෙලීමේ සිට වෙළඳපොළ වෙත ළගාවීමේ ක්‍රියාවලිය තුළ හානියට ලක්වන **අවස්ථා 3ක්** ලියන්න

ii)a)ආහාර කල්තබා ගැනීම සඳහා භාවිතා කරන නිර්දේශිත **පරිරක්ෂක ද්‍රව්‍ය 2ක්** ලියන්න

b) ආහාරවල අගය වැඩි කිරීම යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

iii) ආහාරවල අගය වැඩි කිරීමේ **ක්‍රම 3 ක්** ලියා දක්වන්න

6) බීජවලින් හැර ශාකයේ අනෙකුත් කොටස්වලින් නව ශාක බිහිකර ගැනිම වර්ධක ප්‍රචාරණයයි.

i)a) ශාක බද්ධ කිරිම යනු කුමක්දැයි හඳුන්වා දෙන්න

b)ශාක බද්ධ කිරිම සඳහා යොදා ගන්නා ග්‍රාහකයක තිබිය යුතු **ගුණාංග දෙකක්** සඳහන් කරන්න

ii)a)පහත සඳහන් වර්ධක කොටස්වලට **උදාහරණ එක බැගින්** දක්වන්න

රෛසෝම

බල්බිල

ස්කන්ධ ආකන්ධ

ධාවක

b) සූර්ය ප්‍රචාරකයන් තුළ ශාක අතු මුල් ඇදීම වේගවත් වේ. එයට **හේතු 2 ක්** සඳහන් කරන්න

iii) වර්ධක ප්‍රචාරණයේ **වාසි දෙකක්** ලියන්න

7) සත්ව පාලන ක්‍රම, සත්ත්ව ආහාර, සත්ත්ව රෝග, සත්ත්ව රෝග පාලනය යන කරුණු පිළිබඳව ඉගෙන ගැනීම සත්ත්ව පාලනය ලාභදායි ව්‍යාපාරයක් ලෙස පවත්වා ගැනීමට හේතු වේ.

i) a) ශ්‍රී ලංකාවේ වාණිජ මට්ටමින් කුකුලන් ඇති කිරිමට බහුලව යොදා ගන්නා **ක්‍රමය** නම් කරන්න

b) කුකුළන්ට වැළදෙන බැක්ටීරියා රෝගයක් නම්කර එහි රෝග **කාරකයා, රෝග ලක්ෂණ, පාලනය** කරන ආකාරය ලියා දක්වන්න.

ii) a)ශ්‍රී ලංකාවේ ගවයින් ඇති කිරිමේ **ප්‍රධාන කලාප 2 ක්** නම් කරන්න.

b)නිදැලි ක්‍රමයට ගොවිපල සතුන් ඇති කිරිමෙ දී අත්වන **වාසි 2ක්** ලියා දක්වන්න

iii) ගව දෙනුන් විසින් පෙන්නුම් කරන **මද ලක්ෂණ තුනක්** ලියා දක්වන්න.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය 11

# තෙවන වාර පරීක්ෂණය - 2023

## කෘෂි හා ආහාර තාක්ෂණය

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ............................ කාලය : පැය 03

**පිළිතුරු**
**I පත්‍රය**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1) | 4 | 11) | 4 | 21) | 3 | 31) | 2 |
| 2) | 2 | 12) | 3 | 22) | 4 | 32) | 3 |
| 3) | 1 | 13) | 2 | 23) | 2 | 33) | 1 |
| 4) | 2 | 14) | 4 | 24) | 3 | 34) | 1 |
| 5) | 4 | 15) | 1 | 25) | 2 | 35) | 3 |
| 6) | 3 | 16) | 1 | 26) | 3 | 36) | 3 |
| 7) | 1 | 17) | 3 | 27) | 3 | 37) | 2 |
| 8) | 3 | 18) | 1 | 28) | 3 | 38) | 3 |
| 9) | 3 | 19) | 4 | 29) | 1 | 39) | 3 |
| 10) | 2 | 20) | 2 | 30) | 1 | 40) | 2 |

(ලකුණු 1 x 40 = 40)

1) i) A – අර්තාපල්, බටු, මිරිස්, තක්කාලි
B – බණ්ඩක්කා, කපු (ලකුණු 1/2 x 4 = 2)

ii) උදැල්ල, හෝ වර්ග, අත්මුල්ලුව, තුන්පුරුක් කල්ටිවේටරය, අත්කෝප්පය (ලකුණු 1x 2 = 2)

iii) පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරිම
පස බුරුල් කිරීම
ජල වහනය දියුණු කිරිම
පස ආම්ලික හෝ භාෂ්මික නම් උදාසීන කිරිම පිළියම් යෙදීම
පාංශු ඛාදනය සිදුවන්නේ නම් පාංශු සංරක්ෂණ ක්‍රම යෙදීම (ලකුණු 1x 2 = 2)

iv) වී,කංකුන්, කොහිළ, මුකුණුවැන්න, ගොටුකොළ (ලකුණු 1x 2 = 2)

v) a – කරවිල, වැටකොළු, පතෝල, දඹල, බටු, ගෝවා, මිරිස්
b- මිරිස්, තක්කාලි, බටු, එළුනු
c- මුකුණුවැන්න, ගොටුකොළ, කංකුන්
d – බතල, රටකජු, රාබු (ලකුණු 1/2x 4 = 2)

vi) දහස්පෙතියා, සූරියකාන්ත, කපුරු (ලකුණු 1x 2 = 2)

vii) නයිට්‍රජන් + පොස්පරස්, නයිට්‍රජන් + පොටෑසියම් (ලකුණු = 2)

viii) රෝගී ශාක ක්ෂේත්‍රයන් ඉවත් කිරිම
වගාව අවට පිරිසිදුව තබා ගැනීම

ධාරක වල්පැළෑටි විනාශ කිරීම

බෝගවලට සමතුලිත පොහොර මිශ්‍රණ ලබාදීම

නිශ්චිත පැල ගහනයක් පවත්වාගෙන යාම (ලකුණු 1x 2 = 2)

xi) ජලාකර්ශන ජලය (ලකුණු = 2)

x) ධාන්‍ය බෝගවල පඳුරු දැමීමට

පත්‍රවල ක්ෂේත්‍රඵලය වැඩිවීම

සංචිත ආහාර ප්‍රමාණය වැඩිවීම

ශාකයේ ක්ලෝරනිල් හා අත්තොසයකින් වර්ණක සංස්ලේෂණයට (ලකුණු 1x 2 = 2)

2) i)a කාලගුණය - යම් ප්‍රදේශයක කෙටි කාලයක් තුල වායුගෝලයේ පවතින් ස්වභාවය

දේශගුණය - දීර්ඝ කාලයක් තුල යම් ප්‍රදේශයක කාලගුණික දත්ත අධ්‍යයනය කර ලබා ගන්නා නිගමනය

(ලකුණු 1/2x 2 = 1)

b මෝසම්, සංවහන, වාසුළි (ලකුණු 1x 2 = 2)

c උත්ස්වේදනය - උෂ්ණත්වය, සුළඟ

ශාක රෝග වැඩිවීම - වර්ෂාපතනය, සුළඟ, ආර්ද්‍රතාවය (ලකුණු 1/2x 2 = 1)

ii)a අම්ල වැසි ඇතිවීම, අධික වර්ෂාව නිසා පසේ ඇති භාෂ්මික අංග පසතුලට ක්ෂරණය වීම, කාබනික ද්‍රව්‍ය වියෝජනයේ දී නිතර අම්ල පසට එකතු වීම. (ලකුණු 1x 2 = 2)

b පසට ජිප්සම් එකතු කිරීම

පසට ගෙන්දගම් එකතු කිරීම

පසට කාබනික ද්‍රව්‍ය එකතු කිරීම (ලකුණු 1x 2 = 2)

iii) පාංශු ජීවීන්ගේ ශ්වසනයට, බීජ ප්‍රරෝහණයට ශාක මුල්වල ශ්වසනයට, කාබනික ද්‍රව්‍ය වියෝජනයට පාංශු ජනනයට

(ලකුණු 1x 2 = 2)

3) i)a) මහා මූලද්‍රව්‍ය - N,P,K,C,H,O,Ca,Mg,S

ක්ෂුද්‍ර මූලද්‍රව්‍ය - Zn,Cu, Mb, B, Fe, Cl (ලකුණු 1/2x 4 = 2)

b) මියුරියේඩ් ඔෆ් පොටෑෂ්, සල්ෆේට් ඔෆ් පොටෑෂ් (ලකුණු = 1)

c) සෘජු පොහොර - ප්‍රධාන ශාක පෝෂක තුනෙන් (N,P,K) එකක් පමණක් අඩංගු පොහොර උදා- යූරියා

මිශ්‍ර පොහොර - ප්‍රධාන පෝෂක එකක් වැඩි ගණනක් සැපයෙන පොහොර

උදා - එළවළු පොහොර මිශ්‍රණය

බණ්ඩි පොහොර මිශ්‍රණය (ලකුණු 1x 2 = 2)

ii) a) පසේ හොඳ තෙතමනයක් ඇතිවිට පොහොර යෙදීම බෝග වර්ගය, බෝගයේ වයස අනුව ගැලපෙන පොහරෝ ලබාදීම සුදුසු දේශගුණික තත්ත්ව යටතේ පොහොර යෙදීම, ඒකාබද්ධ ශාක පෝෂක කළමණාකරණ ක්‍රම භාවිතා කිරීම.

(ලකුණු 1x 2 = 2)

b) කොම්පෝස්ට් , ගොම පොහොර, කුකුල් පොහොර, එළු පොහොර (ලකුණු 1/2x 2 = 1)

iii) 1. පසේ සවිවරතාව වැඩිවීම

2. පාංශු වාතය දියුණුවීම

3. පස බුරුල්වීම

4. ජල වහනය දියුණුවීම

5. ජලය රඳවා ගැනිමේ හැකියාව වැඩිවීම

6. පසේ උෂ්ණත්වය වැඩිවීම (ලකුණු 1/2x 4= 2)

4) i)a) කොළ පාළුව, කොපු අංගමාරය (ලකුණු 1x 1 = 1)

b) අතින් ඉවත් කිරිම, උදලු ගෑම, ජලයෙන් පට කිරිම, වායව කොටස් කපා දැමීම, හොඳින් බිම් සැකසීම, වල් පැලෑටි පාලනයට ජීවීන් යොදා ගැනිම (ලකුණු 1/2x 4= 2)

ii)a - වටපණුවන්

b - බැක්ටීරියා

c - දිලීර

d - වෛරස් (ලකුණු 1/2x 4= 2)

iii)a - පූර්ණ රූපාන්තරය අවශ්ම් 4 කි, බිත්තර , කීට, පිලා, සුහුඹුල්

උදා - කළු පොල් කුරුමිණියා, ඉල්මැස්සා, පළතුරු මැස්සා, එපිලැන්ගා

අර්ධ රූපාන්තරණය - අවස්ථා 3 කි., බිත්තර , සිසු, සුහුඹුල්

උදා - ගොම් මිශ්‍රණය, කීඩෑවන් (ලකුණු 2x 2= 2)

b) BG 300, BG 379 – 2 (ලකුණු 1/2x 2= 1)

5) i) a) පැසවීම - යෝගට් , චීස් මුදවපු කිරි

සාන්ද්‍රීකරණය - ජෑම්, චට්නි, ලුණුදෙහි

ජීවානුහරණය - ජීවානුහරිත කිරි

දුම්ගැසීම - මස්,මාළු

රසායනික පරීක්ෂක ද්‍රව්‍ය යෙදීම - පලතුරු බීම, මස්, චීස් (ලකුණු 1/2x 6= 3)

b) අස්වනු නෙලීමේ දී

අස්වනු ඇසිරීමේ දී

අස්වනු ප්‍රවාහනයේ දී (ලකුණු 1x 3= 3)

අස්වනු ගබඩා කිරිමේ දී

ii)a) බෙන්සොයික් අම්ලය

සෝඩියම් නයිට්‍රයිට

සෝඩියම් නයිට්‍රේට (ලකුණු 1/2x 2= 1)

b) ආහාරවල ගුණාත්මක බව වැඩි කිරීම සඳහා පෝෂකයක් හෝ පෝෂක කිහිපයක් සම්මත ප්‍රමාණවලින් ආහාරයට එක්කර ගැනීම (ලකුණු 1/2x 2= 1)

iii) සරු කිරීම, ප්‍රබල කිරිම, අවම සැකසීම (ලකුණු 1/2x 3= 1 1/2)

6) i) a) යම් ශාකයක කොටසක් එම ශාකය අයත් කුලයේ ම වෙනත් ශාකයට සම්බන්ධ කර තම කොටස් දෙක තනි ශාකයක් ලෙස වර්ධනය වීමට සැලැස්වීමයි (ලකුණු = 2)

b) අහිතකර පරිසර තත්ත්ව වලට ඔරොත්තුදීමේ හැකියාව ඒකාකාරී වර්ධනයක් තිබීම

පහසුවෙන් සපයා ගත හැකිවීම

අනුජයේ වර්ධනයට සමාන වර්ධන වේගයකින් යුක්තවීම

අනුජය අයත් කුලයේ ම වීම

ශක්තිමත් මූල පද්ධතියක් තිබීම (ලකුණු = 2)

ii) a) රෛසෝම - කහ,ඉඟුරු , කැනාස්, බුත්සරණ

බල්බිල - ගෝනියාස්

ස්කන්ධ ආකන්ධ - අර්තාපල්, ඉන්නල

ධාවක - ගොටුකොළ , ස්ට්‍රෝබෙරි (ලකුණු 1/2x 4= 2)

b) ඉඟුරු උෂ්ණත්වය

ඉහළ සාපේක්ෂ ආර්ද්‍රතාවය (ලකුණු 1x 2= 2)

iii) මව් ශාකයට සමාන පැළ ලබාගත හැකිවීම

බීජ නොනිපදවන ශාක ප්‍රචාරණ කරගත හැකි වීම

ඵල දැරීමට ගතවන කාලය සාපේක්ෂව අඩුවීම

ශාක කුඩා නිසා වැඩි පැළ සංඛ්‍යාවක් සිටුවිය හැකි වීම

බීජ ප්‍රරෝහණය කර ගැනීමට අපහසු ශාක ප්‍රචාරණය කර ගතහැකිවීම (ලකුණු 1x 2= 2)

7) i)a) සණ ආස්තරණය ක්‍රමය (ලකුණු = 1)

b) බැක්ටීරියා රෝගය - පුල්ලෝරම් රෝගය (ලකුණු = 1)

රෝග කාරකය - සැල්මොනෙල්ලා පුල්ලෝරම් (ලකුණු = 1)

රෝග ලක්ෂණ - 1.බිත්තරවලින් බිහිවූ පැටවුන් දින 1 - 2 දී මියයාම

2. පැටව් එකට ගුලිවී සිටීම

3. නිතර කෑ ගැසීම

4. සුදුපාටට මළපිටවීම

රෝග පාලනය - නිවාස විෂබීජ නාශනය කිරීම

විශ්වාසදයි ගොවිපලකින් පැටව් මිලදී ගැනීම

පිරිසිදු ආහාර හා ජලය ලබාදීම

නිරෝගී සතුන්ගෙන් ලබාගත් පිරිසිදු බිත්තර රැක්කවීමට තැබීම (ලකුණු = 1)

ii) a) 1. උඩරට කලාපය

2. මැදරට කලාපය

3. පහතරට කලාපය

4. පහතරට වියළි කලාපය

5. පොල් ත්‍රිකෝණය

6. යාපන අර්ධද්වීපය (ලකුණු 1/2x 2= 1)

b) ආහාර සඳහා වියදම් නොයෑම

රැකබලා ගැනීම පහසුවීම

සතුන්ට ව්‍යායාම ලැබීම

ඉඩකඩ බහුල ප්‍රදේශවලට යෝග්‍ය ක්‍රමයකි

ශ්‍රම අවශ්‍යතාවය (පාලන කටයුතු සඳහා) අඩුයි (ලකුණු 1/2x 2= 1)

iii) ආහාර ගැනීම අඩුවීම

සතුන් නිතර නිතර කෑගැසීම

නොසන්සුන් බවත් පෙන්වීම

පිට මත අත තැබ විට නොසෙල්වී සිටීම

වෙනත් සතුන්ට තම පිට මත නැගීමට ඉඩදීම (ලකුණු 1x 3= 3)

8)


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න